(නවවැනි පාර්ලිමේන්තුව - පස්වැනි සභාවාරය)

අංක 1(10).]

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2024 මැයි 22 බදාදා**

---

**2024 ජූනි 04 අඟහරුවාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— සුබසාධක ප්‍රතිලාභ පනත යටතේ නියෝග,— 2002 අංක 24 දරන සුබසාධක ප්‍රතිලාභ පනතේ 7(3), 8, 10, 11 සහ 12 වගන්ති සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(3) ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු එම පනතේ 27 වගන්තිය යටතේ සුබසාධක ප්‍රතිලාභ සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2024 අප්‍රේල් 29 දිනැති අංක 2382/02 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.05.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— අත්‍යාවශ්‍ය මහජන සේවා පනත යටතේ යෝජනා සම්මතය,— 1979 අංක 61 දරන අත්‍යාවශ්‍ය මහජන සේවා පනතේ 2 වගන්තිය ප්‍රකාරව ජනාධිපතිවරයා වෙත පැවරී ඇති බලතල අනුව, 2024 මැයි 21 දිනැති අංක 2385/11 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ හා එහි උපලේඛනයෙහි පළ කරනු ලැබ, 2024.05.22 දින ඉදිරිපත් කරන ලද ප්‍රකාශනය අනුමත කළ යුතු ය.

මාතර සමය සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

***** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

**2024 ජූනි 05 බදාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

***** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

**2024 ජූනි 07 සිකුරාදා**

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

පා.39/2024

ගරු රෝහණ බංඩාර මහතා,— ඩිජිටල් අධ්‍යාපන ක්‍රමයට අවශ්‍ය මූලික පදනම සකස් කිරීමට වැඩසටහනක් සකස් කිරීම,— වර්තමානය වනවිට ලෝකය ඉතා සීඝ්‍රයෙන් වෙනස් වන පසුබිමක පවතින හෙයින් ඊට අනුරූපව අධ්‍යාපන ක්‍රමය ද වෙනස් විය යුතු හෙයින් ශ්‍රී ලංකාව තුළ ද ඩිජිටල් අධ්‍යාපන ක්‍රමය සඳහා අවශ්‍ය පසුබිම සකස් කිරීමට රජය විසින් සුදුසු වැඩසටහනක් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.40/2024

ගරු රෝහණ බංඩාර මහතා,— ක්‍රීඩා අමාත්‍යාංශයේ විගණන සහ නීති අංශ ශක්තිමත් කිරීමට වැඩසටහනක් සකස් කිරීම,— වර්තමානය වනවිට ශ්‍රී ලංකාවේ ක්‍රිකට් ඇතුළු ක්‍රීඩා සංගම් රැසක් අතිශය දූෂිත තත්ත්වයට පත් වී ඇති හෙයින් එම තත්ත්වය මැඩපැවැත්වීම සඳහා ක්‍රීඩා අමාත්‍යාංශයේ විගණන හා නීති අංශ ශක්තිමත් කිරීමට රජය විසින් වැඩසටහනක් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.41/2024

ගරු රෝහණ බංඩාර මහතා,— සමුපකාර ග්‍රාමීය බැංකුවල තැන්පත්කරුවන්ගේ තැන්පතු ආරක්ෂා කිරීම,— සමුපකාර ව්‍යාපාරයට සම්බන්ධ ග්‍රාමීය සමුපකාර බැංකු කෙරෙහි ග්‍රාමීය ජනතාවගේ විශ්වාසය ඉහළ මට්ටමක පැවතිය ද විවිධ ගැටලු හේතුවෙන් දෙහිවල-ගල්කිස්ස සමුපකාර ග්‍රාමීය බැංකුව, මහරගම සමුපකාර ග්‍රාමීය බැංකුව වැනි ග්‍රාමීය බැංකු මේ වනවිට බිඳ වැටී ඇති හෙයින් ඉතා අසීරු තත්ත්වයකට පත් වී ඇති එහි තැන්පත්කරුවන්ට සාධාරණය ඉටු කිරීම සඳහා සුදුසු වැඩසටහනක් රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.42/2024

ගරු රෝහණ බංඩාර මහතා,— සේවක අර්ථසාධක අරමුදලේ මුදල් ඵලදායීව ආයෝජනය කිරීම,— පෞද්ගලික අංශයේ සේවකයන්ගේ සුබසාධනය උදෙසා පිහිටුවා ඇති සේවක අර්ථසාධක අරමුදල සතු මුදල්, කොටස් වෙළඳපොළ තුළ ලැයිස්තු ගත නොකළ සමාගම්වල ආයෝජනය කිරීම තුළින් කිසිදු ප්‍රතිලාභයක් අත් වී නොමැති බවට ජාතික විගණන වාර්තාවෙන් පෙන්වා දී ඇති හෙයින්, පෞද්ගලික අංශයේ සේවකයන්ට වැඩි ප්‍රතිලාභ අත්වන පරිදි එම අරමුදල් ඵලදායී ක්ෂේත්‍රවල ආයෝජනය කිරීමට රජය විසින් සුදුසු වැඩසටහනක් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.43/2024

ගරු රෝහණ බංඩාර මහතා,— දුම්රිය දෙපාර්තමේන්තුව තුළ කාලීන වෙනස්කම්වලට ඔරොත්තු දිය හැකි ආයතන ව්‍යුහයක් සකස් කිරීම,— සීඝ්‍රයෙන් තාක්ෂණය වෙනස් වෙමින් පවතින ලෝකයේ, අධිරාජ්‍යවාදීන්ගේ සමයේ හඳුන්වා දුන් දෙපාර්තමේන්තු රාමුව යටතේ දුම්රිය දෙපාර්තමේන්තුව තවදුරටත් පවත්වාගෙන යා නොහැකි හෙයින්, එම දෙපාර්තමේන්තුව තුළ කාලීන වෙනස්කම්වලට ඔරොත්තු දිය හැකි ආයතන ව්‍යුහයක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.44/2024

ගරු රෝහණ බංඩාර මහතා,— මූල්‍ය සාක්ෂරතාවය ඉහළ නැංවීම,— ලිවීමට සහ කියවීමට ඇති හැකියාව හෙවත් සාක්ෂරතාවය ශ්‍රී ලංකාවේ ඉහළ අගයක පැවතුන ද, මූල්‍ය සාක්ෂරතාවය තවමත් පහළ අගයක පවතින හෙයින්, පාසල් අවධියේ සිටම මූල්‍ය සාක්ෂරතාවය ජනගත කිරීම සඳහා සුදුසු වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.45/2024

ගරු රොෂාන් රණසිංහ මහතා,— ශ්‍රී ලාංකික ශිෂ්‍ය ප්‍රජාවට සිය අනාගතය සාර්ථක කරගැනීම සඳහා ජාතික වෘත්තීය මාර්ගෝපදේශන විධිමත් අයුරින් ලබාදීම,— ශ්‍රී ලංකාවේ අ.පො.ස. (සා. පෙළ) සහ අ.පො.ස. (උ. පෙළ) විභාග සඳහා ලක්ෂ සංඛ්‍යාත සිසු පිරිසක් වාර්ෂිකව පෙනී සිටින හෙයින් ද, මෙම විභාගවලින් සමත්වන සහ අසමත්වන සිසු පරපුරේ අනාගතය සකස්කර ගත යුතු ආකාරය පිළිබඳ සිසුන් බහුතරයකට හා ඔවුන්ගේ දෙමව්පියන්ට නිසි අවබෝධයක් නොමැති බව නිරීක්ෂණය වී ඇති හෙයින් ද, නිවැරදි වෘත්තීය මාර්ගෝපදේශනයක් ලබාදීම සඳහා පිහිටුවා ඇති රාජ්‍ය ආයතන මඟින් සිය යුතුකම් හා වගකීම් නිසි අයුරින් ඉටු නොකරන බව පෙනී යන හෙයින් ද, ශ්‍රී ලංකාවේ පවතින විශ්වවිද්‍යාල පද්ධතිය තුළ පවත්වාගෙන යන උපාධි පාඨමාලා, කාර්මික හා තාක්ෂණ විද්‍යාල හා ඒවායේ පාඨමාලා, පිළිගත් පෞද්ගලික විශ්වවිද්‍යාල පිළිබඳ අවබෝධය, ලෝකයේ පිළිගත් විදේශීය විශ්වවිද්‍යාල පිළිබඳ අවබෝධය සහ දේශීය හා විදේශීය ශිෂ්‍යත්ව ලබාගැනීමේ ක්‍රමවේද පිළිබඳ අවබෝධය විධිමත් අයුරින් ලබාදීම සඳහා ශිෂ්‍ය ප්‍රජාව දැනුම්වත් කිරීමට නිවැරදි වෘත්තීය මාර්ගෝපදේශනයක් ලබාදීම පිණිස රජය විසින් ස්ථිරසාර ජාතික වැඩපිළිවෙළක් ස්ථාපනය කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.46/2024

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය,— දේශපාලන පක්ෂවල නිලධාරි මණ්ඩල තුළ කාන්තාවන්ගේ නියෝජනය ඉහළ නැංවීම,— දේශපාලනය තුළ කාන්තා සහභාගිත්වය සහ පාර්ලිමේන්තුව තුළ කාන්තා නියෝජනය ඉහළ දැමීමේ සාකල්‍ය ප්‍රවේශයක් ලෙස සෑම ලියාපදිංචි දේශපාලන පක්ෂයක් විසින්ම ස්වකීය විධායක කාරක සභාවේ තීරණ ගැනීමේ මට්ටම/ ධාරිතාව තුළ අවම වශයෙන් 30%ක් කාන්තාවන් පත් කිරීමට අවශ්‍ය කටයුතු රජය විසින් සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.